# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපාය , බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 1725/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திகதி / Date – 18/11/2024 පැය 1255

## මාධ්‍ය නිවේදනය

### පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු

**01. 2024.11.17 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 12 | 12 | 274 | 1080 | තඹ දඟර 05<br>යකඩ බැරල් 02<br>ගෑස් සිලිණ්ඩර් 01<br>ගෑස් ලිප් 01 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථානයන් වෙත ඉදිරිපත් කර ඇත.

**02. හෙරොයින් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාසය.**

2024.11.17 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් මිරිහාන පොලිස් වසමේ වැටලීම් දෙකක් සිදුකර හෙරොයින් මත්ද්‍රව්‍ය ග්‍රෑම් **08** මිලි ග්‍රෑම් **650** ක් හා හෙරොයින් මත්ද්‍රව්‍ය ග්‍රෑම් **06** මිලි ග්‍රෑම් **450** ක් සන්තකයේ තබා ගනිමින් සිටි සැකකරුවන් දෙදෙනෙක් අත්අඩංගුවට ගෙන මිරිහාන පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු අවුරුදු 29 හා 31 වයස් වල පසුවන කෝට්ටේ ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.** මිරිහාන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. හෙරොයින් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාසය.**

2024.11.17 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් බොරලැස්ගමුව පොලිස් වසමේ වැටලීමක් සිදුකර **හෙරොයින් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12 මිලි ග්‍රෑම් 550 ක් සන්තකයේ තබා ගනිමින් සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන බොරලැස්ගමුව පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 33 ක් වන ගල්කිස්ස ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.** බොරලැස්ගමුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04. අයිස් මත්ද්‍රව්‍ය හා හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මොරටුව කඳවුර.**

2024.11.17 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා මොරටුව කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ගල්කිස්ස පොලිස් වසමේ වැටලීමක් සිදුකර අයිස් මත්ද්‍රව්‍ය **ග්‍රෑම් 15 මිලි ග්‍රෑම් 555 ක්, හෙරොයින් මිලි ග්‍රෑම් 840 ක් හා** මත්ද්‍රව්‍ය අලෙවියෙන් උපයාගත් බවට සැක කලහැකි මුදල් රුපියල් **14,500/= ක් සන්තකයේ** තබා ගනිමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 33 ක් වන ගල්කිස්ස ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.** ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05. අයිස් මත්ද්‍රව්‍ය හා හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අහුංගල්ල කඳවුර.**

2024.11.17 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා අහුංගල්ල කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් අහුංගල්ල පොලිස් වසමේ වැටලීමක් සිදුකර අයිස් මත්ද්‍රව්‍ය **ග්‍රෑම් 100 මිලි ග්‍රෑම් 850 ක්, හෙරොයින් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 25 මිලි ග්‍රෑම් 110 ක් හා ජංගම දුරකථන 01 ක් සන්තකයේ තබා ගනිමින් සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන අහුංගල්ල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 34 ක් වන කොස්ගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.** අහුංගල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06. කේරළ ගංජා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කන්තලේ කඳවුර.**

2024.11.17 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කන්තලේ කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් හබරණ පොලිස් වසමේ වැටලීමක් සිදුකර **කේරළ ගංජා කිලෝග්‍රෑම් 02 ග්‍රෑම් 50 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන හබරණ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 50 ක් වන ඉබ්බාගමුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.** හබරණ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**07. කේරළ ගංජා සමඟ සැකකරුවන් තිදෙනෙක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කන්තලේ කඳවුර.**

2024.11.17 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කන්තලේ කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් කුඹුක්ගැටේ පොලිස් වසමේ වැටලීමක් සිදුකර **කේරළ ගංජා කිලෝග්‍රෑම් 02 ග්‍රෑම් 70 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු හා ඊට අනුබලදීම සම්බන්ධයෙන් තවත් සැකකරුවන් දෙදෙනෙක්** අත්අඩංගුවට ගෙන කුඹුක්ගැටේ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 44 ක් වන නිකදළුපොත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.** කුඹුක්ගැටේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**08. මෙරට නිෂ්පාදිත ගිනි අවි තුනක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා දඹුල්ල කඳවුර.**

2024.11.17 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා දඹුල්ල කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් සීගිරිය පොලිස් වසමේ නාගලවැව ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවි තුනක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන සීගිරිය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 55 ක් වූ නාගලවැව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.** සීගිරිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**